සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය

සැකසුම : රත්නපුර අධ්‍යාපන කලාපය

කේ.පී. ගීතානි දිල්රුක්ෂි - ර/රාජකීය විද්‍යාලය

පරිගණක සහය: ආර්.කේ.ඕ.කෞශල්‍යා රණසිංහ - ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල

# 4 පාඩම - අඩු කිරීම - 1

## පෙර වැඩ කාර්ය පත්‍රිකාව

- **මේවා සූදානම් කර ගනිමු.**
  - **හිස් යෝගට් කප් දෙකක් හා ගණක ( මදටිය , ගල් කැට ) 25ක්.**
  - **කූරු දෙකේ ගණක රාමුවක්. ( කූරුවලට පබලු ඇට , රබර් ඇට වැනි ද්‍රව්‍ය 9ක් බැගින් යොදා සූදානම් කරගන්න.**
  - **දහයේ ඉරටු මිටි නවයක් හා තනි ඉරටු නවයක්.**
  - **A4 කොළයක පහත දක්වා ඇති ගණක පෙත ඇඳ සූදානම් කරගන්න**

| දහයස්ථානය. | එකස්ථානය |
|---|---|
| | |

*ටික්කා විදීමේ ක්‍රීඩාව සඳහා පහත උපදෙස් අනුගමනය කරමින් ද්‍රව්‍ය සූදානම් කරගන්න.


- විශ්කම්භය ( වෘත්තය හරි මැද හරහා යමින් ඇඳෙන රේඛාව ) සෙන්ටිමීටර 10ක වෘත්තයක් කාඩ්බෝඩ් එකක ඇඳ කපාගන්න.

- එම වෘත්තය වටා ඇතුළට සෙන්ටිමීටර 1ක් ලකුණු කරමින් වෘත්තය තුළ ඊට කුඩා වෘත්තයක් ඇඳ ගන්න.

- වෘත්තයේ හරි මැද කුඩා වෘත්තයක් ඇඳ , මැද ඇති සංඛ්‍යාව එහි ලියන්න.

- දැන් පෙන්වා ඇති ආකාරයට වෘත්තය සමාන කොටස් දහසයකට බෙදමින් එක් එක් කොටස තුළ දක්වා ඇති සංඛ්‍යා ලියන්න.

- හිස් කාබන් පෑනක් හා හැට්ට කටුවක් / ආාය කටුවක්.



සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය

සැකසුම : රත්නපුර අධ්‍යාපන කලාපය

කේ.පී. ගීතානි දිල්රුක්ෂි - ර/රාජකීය විද්‍යාලය

පරිගණක සහය: ආර්.කේ.ඕ.කෞශල්‍යා රණසිංහ - ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල

## 4 පාඩම - අඩු කිරීම - 1

## පැවරුම

- **යෝගට් කප් දෙක හා ගණක ඔබ ඉදිරියෙන් තබාගන්න.**


- **හිස් යෝගට් කප් එකකට ගණක 18ක් දමන්න.**

**ඉන් ගණක 12ක් අනෙක් කප් එකට ඉවත් කරන්න. ඉතිරි ගණක ගණන කීය ද?**

- **හිස් යෝගට් කප් එකට ගණක විස්සක් ගැන දමන්න. ඉන් ගණක නවයක් ඉවත් කරන්න. ඉතිරි ගණක ගණන සොයන්න.**

**ගණක රාමුව හා හිස් යෝගට් කප් එකක් ඔබ ඉදිරියේ තබාගන්න.**

**ගණක රාමුවේ 37 සංඛ්‍යාව නිරූපණය කරන්න. එම 37 සංඛ්‍යාවෙන් 25ක් අඩු කරන්න.**



( පළමුව එකස්ථානයේ ගණක 5ද, දෙවනුව දහයස්ථානයේ ගණක 2ද ඉවත් කරන්න.)



1) 37 – 25 පිළිතුර කීය ද?

49 සංඛ්‍යාව ගණක රාමුවේ නිරූපණය කරන්න. ඉන් 24ක් ඉවත් කරන්න.

2) 49 – 24 පිළිතුර කීය ද?
3) 58 – 13 පිළිතුර කීය ද?
4) 77 – 32 පිළිතුර කීයක් ලැබුණි ද?

ගණකපෙත , ඉරටු මිටි හා තනි ඉරටු ඔබ ඉදිරියේ තබා ගන්න.

- 37 සංඛ්‍යාව පහත ආකාරයට එහි නිරූපණය කරන්න.

| දහයස්ථානය. | එකස්ථානය |
|---|---|
|  |  |

37 සංඛ්‍යාවෙන් 26ක් අඩු කරන්න.

( පළමුව තනි ඉරටු 6කේ හා අනතුරු ව ඉරටු මිටි 2ක් ඉවත් කරන්න.

1) 37 – 26 පිළිතුර කීය ද?
2) 78 ගණක පෙතෙ නිරූපණය කරන්න.

   එයින් 20ක් අඩු කරන්න.78 - 20 පිළිතුර කීය ද?
3) 86 – 13 පිළිතුර කීය ද?

පිළිතුරු පවසන්න.

1) 16 හා 7 සංඛ්‍යා දෙකෙන් ලොකු සංඛ්‍යාව කුමක් ද? කුඩා සංඛ්‍යාව කුමක් ද? ලොකු සංඛ්‍යාව හා කුඩා සංඛ්‍යාව අතර වෙනස කීය ද?

2) මගේ වයස අවුරුදු 9යි. අයියගේ වයස අවුරුදු 15යි. අයියා මට වඩා අවුරුදු කීයක් වැඩිමහල් ද?

3) නිශා වෙරළු ගෙඩි 18ක් ඇහින්දා. නදී වෙරළු ගෙඩි 12ක් ඇහින්දා.නිශා ළඟ ඇති වෙරළු ගණනට සමාන වීමට නදී තවත් වෙරළු කීයක් ඇහිදිය යුතු ද?

4) වෙළෙන්දෙක් අලෙවිය සඳහා ඉරිදා පොළට පොල් ගෙඩි 78ක් රැගෙන ආවා. එදින අවසානයේ පොල් ගෙඩි 13ක් ඉතිරි වී තිබුණා. එදින විකිණී ඇති පොල් ගණන කීය ද?

5) බිත්තර ඇසුරුම් පෙට්ටියක ඇසිරීමට හැකි බිත්තර ගණන 56කි. දැනට එහි බිත්තර 24ක් අසුරා ඇත. තවත් බිත්තර කීයක් එහි තැබිය හැකි ද?

<u>හිස් කොටු පුරවමු.</u>

| 1) | 2) | 3) | 4) | 5) |
|---|---|---|---|---|
| 7 6 | 8 0 | 6 □ | 4 9 | □□ |
| - □ | - □□ | - □ 4 | - 3 1 | - 3 5 |
| □ 3 | 4 0 | 2 3 | □□ | 5 2 |

ඊතල දෙසට අඩු කරමින් හිස් කොටු පුරවමු.

1) 87 – 12 = ☐

- 14

☐

2) 56

- 12

☐ - 32 = ☐

3) 76 - ☐ = 44

- 11

☐

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය

සැකසුම : රත්නපුර අධ්‍යාපන කලාපය

කේ.පී. ගීතානි දිල්රුක්ෂි - ර/රාජකීය විද්‍යාලය


පරිගණක සහය: ආර්.කේ.ඕ.කෞශල්‍යා රණසිංහ - ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල

4 පාඩම - අඩු කිරීම - 1


පසු වැඩ කාර්ය පත්‍රිකාව

**දුවේ, පුතේ, විනෝදයට ටික්කා විදිමු.**

- **ඔබ සූදානම් කරගත් සංඛ්‍යා රවුම, හිස් කාබන් පෑන හා හැට්ට කටුව මේසය මතට ගන්න.**






- **රවුමේ හරි මැද ඇති සංඛ්‍යාව මත හැට්ට කටුවෙ කුඩා රවුම සිටින සේ තබා පෑන් තුඩ ඒ මත තබන්න.**

**( පෑන් තුඩෙන් කටුව ඉවත් ව නොයන සේ රදවා තබා ගන්න.)**

- **දැන් එක් අතකින් පෑනෙන් කටුව රදවා තබා ගනිමින් අනෙක් අතින් කටුවට විදින්න.**
- **කටුව කරකැවී ගොස් පිහිටි කොටසේ ඇති සංඛ්‍යාව මැද ඇති සංඛ්‍යාවෙන් අඩු කරන්න.**

- **පිළිතුර ඊට ඉදිරියෙන් ඇති හිස් කොටසේ ලියන්න.**

**උදා :- 88 – 62 = 26**




- මේ ආකාරයට නැවත නැවත කටුවට විදිමින් ලැබෙන සංඛ්‍යා මැද ඇති 88 සංඛ්‍යාවෙන් අඩුකරමින් හිස් කොටස් පුරවන්න.
- නිදහස් වෙලාවක මිදුලට යන්න. වැටී ඇති ශාක පත්‍ර 20ක් අහුලා ගන්න.
- අහුලාගත් ශාක පත්‍ර දෝතට ගෙන ඉහලට විසිකරන්න. විසිකළ සැනින් ඔබට හැකි සංඛ්‍යාවක් බිමට නොවැටී අල්ලාගන්න. ශාක පත්‍ර 20න් ඔබ අල්ලාගත් ගණන කීය ද?
- බිම වැටුණු ගණන ගණන් නොකර කොපමණ සංඛ්‍යාවක් දැයි සොයන්න.
- කෝටුවක් ගෙන මිදුලේ එකපෙළට කොටු 15ක් අඳින්න.

( ඔබට පැනීමට හැකි තරම් කොටු )

- එම කොටු එකක් හැර එකක් මත x ලකුණ යොදන්න.
- කතිර නොදැමූ කොටුවලට පමණක් පනිමින් ඉදිරියට යන්න.
- කොටු 15න් ඔබ පැන්න කොටු ගණන කීය ද?
- ඔබ මගහැර ආ කොටු ගණන කීය ද?